**ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය - 2017**

**-----------------------------------------------------------------------**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2009 අංක 38 දරන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතන පනතේ අංක 17(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත 2018 ජුනි 08 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------------

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

--------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පිරිවැය රු.937,760 ක් වූ ගෘහ උපකරණ සහ වෛද්‍ය උපකරණ සමාලෝචිත වර්ෂයේදී රු.429,000 කට ප්‍රත්‍යාගණනයක් සිදුකර එම ප්‍රත්‍යාගණිත අගය වත්කම් එකතු කිරීම් ලෙස දක්වා තිබුණද එම වත්කම්වල පිරිවැය හා සමුච්චිත ක්ෂය හඳුනාගෙන ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 43 වන ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණවල සාධාරණ වටිනාකම වෙළඳපල අගය මත ඇගයීමකින් නිශ්චය කරනු ලබන අතර ඒ සඳහා පිළිගත් හා අදාළ වෘත්තිය සුදුසුකම් ඇති, තක්සේරු වෘත්තියේ සාමාජිකයෙකු විසින් වත්කමක අගය තක්සේරු කල යුතු බව දක්වා තිබුණද ආයතනයේ වත්කම් ප්‍රත්‍යාගණනයේදී එසේ විධිමත් සුදුසුකම් වලින් යුක්ත කමිටුවක් විසින් ප්‍රත්‍යාගණනය සිදුකර නොතිබුණි.

(iii) ප්‍රමිතයේ 49 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම අයත්වන දේපළ, පිරියත හා උපකරණ පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළයුතු වුවද වත්කම් පන්ති දෙකක රු.මිලියන 15.7 ක් පිරිවැය වූ අයිතමයන් සම්බන්ධයෙන් ප්‍රමිතය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iv) ප්‍රමිතයේ 90 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ පන්තියක් ප්‍රත්‍යාගණනය කළ විට උක්ත ප්‍රමිතියේ "අ" සිට "උ" දක්වා කළයුතු හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2**

**---------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය සඳහා සේවක පාරිතෝෂික වෙන්කිරීම රු.312,393 ක් වුවද එය රු.250,278 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගැලපීම් කර තිබුණි.

(ii) එකතුව රු.772,400 ක් වූ පෙර වර්ෂ ගැලපීම් සමාලෝචිත වර්ෂයේ ආදායමට ගැලපීම් කර නොතිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය නොවන ගැලපීම් යටතේ ගැලපීම් කර තිබුණි.

(iii) මූල්‍ය බලපෑමක් නැතිව ආයතනයට ප්‍රදාන වශයෙන් ලැබුණු වෛද්‍ය උපකරණය සඳහා වර්ෂ 04 ක කපා හැරීම් රු.660,000 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාරක ප්‍රාග්ධන ගැලපීම් යටතේ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දැ හි අඩුවීම් ලෙස ගලපා තිබුණි.

(iv) දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබූ මුදල රු. 3,997,265 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම් ලෙස ගෘහභාණ්ඩ ප්‍රත්‍යාගණිත අගය වූ රු. 89,000 ක්ද ඇතුළත්ව රු. 4,086,265 ක් දක්වා තිබුණි.

(v) වර්ෂයේ පොලී ආදායම වූ රු.8,673,884 ක් අතිරික්තයට ගලපා නොතිබුණු අතර මුදලින් ලද පොලී ආදායම වන රු.1,372,664 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස දැක්වීම වෙනුවට මුදල් ගලා යාමක් ලෙස දක්වා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සඳහා 2013 වර්ෂයේ ජාතික විද්‍යා පදනමින් ලැබූ රු. 1,650,000 ක පරිත්‍යාග ගිණුම්ගත කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ නව ගිණුම්කරණ ප්‍රතිපත්තියක් යොදාගෙන තිබුණද එය මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කර නොතිබුණු අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 34 වන ඡේදය ප්‍රකාරව ස්ව කැමැත්තෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් භාවිත කිරීමේදී ප්‍රවර්තන කාලපරිච්ඡේදයට හෝ පෙර කාලපරිච්ඡේදයට හෝ බලපෑමක් වේ නම් එයද හෙළිදරව් කළයුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව පිරියත හා යන්ත්‍රවල ප්‍රයෝජනවත් ජීවිත කාලය වසර 10 ක් ලෙස දක්වා තිබුණද ක්ෂය ගණනය කිරීමේදී ජීවිත කාලය වසර 5 ක් ලෙස සලකා ක්ෂය ගණනය කිරීම කර තිබුණි.

(ඇ) ආයතනය සඳහා 2017 වාර්ෂික ඇස්තමේන්තුවෙන් අයභාර වියදම් සඳහා රු. 2,220,827 ක් ද ප්‍රාග්ධන වියදම් සඳහා රු.2,028,664 ක් ද වශයෙන් භාණ්ඩාගාර ප්‍රතිපාදන ලබා දී තිබුණ ද එම මුදල් ගිණුම්ගත කිරීම පිළිබඳව රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 හි 12 ඡේදය ප්‍රකාරව ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හඳුනාගෙන හෙළිදරව් කර නොතිබුණි.

## 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වටිනාකම රු.288,403 ක්වූ Air Sampling - Pumbs model Gil Air 3RC යන වෛද්‍ය උපකරණය 2015 මැයි 15 දින ක්‍රමාංකනය කිරීම සඳහා රු.188,700 ක මුදලක් වැයකර තිබූ අතර එය අදාල වත්කමට ප්‍රාග්ධනිත කර තිබුණද සමාලෝචිත වර්ෂය දක්වා එකතුව රු.75,480 ක ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) පුනරාවර්තන වියදම් වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් 2017 වර්ෂයේ ප්‍රතිපූර්ණය කරන ලද රු.308,188 ක පුනරාවර්තන ප්‍රදානයන් ප්‍රාග්ධන ප්‍රදානයන් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සුළු මුදල් වලින් වැයකරන ලද රු.15,975 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණු අතර එම හේතුවෙන් වර්ෂයේ ලාභය එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ආයතනය සඳහා 2013 වර්ෂයේ ජාතික විද්‍යා පදනමින් ලැබූ රු.1,650,000 ක පරිත්‍යාග ගිණුම් ගත කිරීමේදී සමාලෝචිත වර්ෂයේ රු.165,000 ක පරිත්‍යාග කපාහැරීම වෙනත් ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ක්ෂය වෙන්කිරීම් ගිණුමට බැරකර තිබුණි.

(ඉ) රජයේ ප්‍රදාන උපචිත මත ගිණුම් තැබීම හේතුවෙන් අමාත්‍යාංශයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස රු.3,628,340 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

## 2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ භාණ්ඩාගාර ගිණුම ලෙස රු. 267,500 ක ශේෂයක් 2010 වර්ෂයේ සිට වර්ෂ 07 ක කාලයක් පුරා නිරවුල් කිරීමකින් තොරව පැවතුණි. එම මුදල මුදල් අමාත්‍යාංශයෙන් ලබාගැනීමට නොහැකි බැවින් ඉදිරියේදී කපා හැරීමට කටයුතු කරන බව සභාපති විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව සේවාදායකයින්ගෙන් ලැබුණු රු.204,137 ක අත්තිකාරම් මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අදාල සේවාව සැපයීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම අත්තිකාරම් මුදල් නිරවුල් නොකිරීමේ කාල ප්‍රමාදය මාස 12 සිට මාස 30 දක්වා පරාසයක විය.

(ඇ) 2012 ජනවාරි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දක්වා වසර දෙකක කාලයක් සඳහා කම්කරු දෙපාර්තමේන්තුවෙන් මුදා හැර තිබූ නිලධාරියා මෙම ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරිය ලෙස කටයුතු කර තිබූ අතර වැටුප් සඳහා ගෙවන ලද රු.1,170,996 ක මුදල නැවත කම්කරු දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය කරන ලෙස ඉල්ලා තිබුණි. ඒ අනුව 2013 වර්ෂයේ දී මෙම මුළු වැටුප් වියදම සඳහා වෙන් කිරීමක් සිදුකර තිබූ නමුත් වර්ෂ 05 ක කාලයක් ගතවී තිබුණද මෙම බැරකම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.18,534,446 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.15,801,620ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,732,826 ක වර්ධනයක් නිරීක්ෂණය විය. වර්ෂයේ මෙහෙයුම් ආදායම රු.5,391,978 කින් ඉහළ යෑම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2014 වර්ෂයේදී රු.19,441,777 ක්වූ අතිරික්තය 2017 වර්ෂය වනවිට රු.18,534,446 දක්වා අඩු වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වන ක්ෂය ප්‍රතිපාදන සැලකිල්ලට ගැනීමෙන් පසු අරමුදලේ සමස්ථ දායකත්වය 2013 වර්ෂයේදී රු.17,104,796 ක් වූ අතර 2015 වර්ෂයේදී රු.12,721,122 දක්වා පිරිහීමකට ලක්ව තිබුණි. කෙසේ නමුත් සමාලෝචිත වර්ෂයේදී එය රු.28,918,806 ක් දක්වා වර්ධනය වී පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

#### 4.1.1 සැලසුම් කිරීම

----------------

ආයතනය විසින් 2017 – 2022 කාලසීමාවන්ට අදාලව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණු අතර ආයතනයේ ස්ථාපිත අරමුණු ඉටුකර ගැනීම සඳහා ව්‍යාපාරය තුළ පවතින ශක්තීන්, දූර්වලතා හා ව්‍යාපාරික පරිසරයේ ඇති අවස්ථාවන් සහ බාධක පිළිබඳ ඇගයීමට ලක්කර නොතිබුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 අංක 38 දරන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ ආයතන පනතේ 3 (1) ඌ වගන්තිය ප්‍රකාරව වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍යයට අදාල වන තොරතුරු එකතු කිරීම ,සකස් කිරීම,ව්‍යාප්ත කිරීමට භාර ගැනීම හා එයට සහය දැක්වීම පරමාර්ථයක් වුවද එවැනි ක්‍රියාමාර්ග ආයතනය විසින් ක්‍රියාවට නංවා නොතිබුණි.

(ආ) එම පනතේ 3(1) (ග) වගන්තිය ප්‍රකාරව වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ ජාතික ප්‍රමිත පිහිටුවීම පරමාර්ථයක් වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එවැනි ජාතික ප්‍රමිත භාවිතයේ නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------------

ආයතනය විසින් ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමඟ ඇති කරගෙන තිබූ ගිවිසුම අනුව ශ්‍රී ලංකාවේ උතුරු නැගෙනහිර පළාත් සඳහා වෘත්තිය ආරක්ෂණය සහ සෞඛ්‍ය සම්බන්ධ හැකියා සංවර්ධන පුහුණු වැඩසටහනක් සමාලෝචිත වර්ෂය තුළදී පවත්වා තිබුණි. එසේ වුවද වැඩසටහන වෙනුවෙන් රු.1,375,326 ක් වියදම් දරා තිබූ අතර ඉතිරි මුදල වූ රු.924,063 ක් ප්‍රේෂණය කිරීමකින් තොරව ආයතනයේ ආදායමක් ලෙස හඳුනා ගෙන තිබුණි. එම වැඩසටහන සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙතින් රු.2,229,389 ක් ලැබී තිබූ අතර ගිවිසුමේ 4.6 ඡේදය ප්‍රකාරව වැඩසටහන නිමකිරීමෙන් අනතුරුව භාවිත නොකර ඉතිරිවන මුදලක් වේ නම් එම සංවිධානය වෙත නැවත යැවිය යුතු විය.

## 4.3 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්/දේපලවල ව්‍යාපෘති ආරම්භ කිරීම

------------------------------------------------------------------------

ආයතනය පවත්වාගෙන යන අංක 97 ජාවත්ත පාරේ පිහිටි ඉඩම හා ගොඩනැගිල්ලේ අයිතිය 2007 ජුනි 08 වන දින කම්කරු දෙපාර්තමේන්තුවේ කර්මාන්ත සුරක්ෂිතා අංශය වෙත පවරා දී තිබුණි. 2017 ජුනි 30 දිනය වන විටත් එම වත්කම් විධිමත් පරිදි ආයතනය වෙතට පවරාගැනීමට කටයුතු කර නොතිබුණු අතර එසේ අයිතිය පවරා ගැනීමකින් තොරව එහි ප්‍රාග්ධන වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.1,121,965 ක් ද පසුගිය වර්ෂයේදී රු.5,644,437 ක් ද වැයකර තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

------------------------------

ආයතනය පිහිටුවා වසර 09 ක් ගත වුවද කාර්මණ්ඩල පුරප්පාඩු දීර්ඝකාලීනව පැවතුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ තනතුරු 04 ක් ද, මෙහෙයුම් මට්ටමේ තනතුරු 04 ක් ද වශයෙන් පුරප්පාඩු 08 ක් පැවතුණි.

## 5. තිරසාර සංවර්ධනය

-----------------------

## 5.1 තිරසර සංවර්ධන අරමුණු ළඟා කරගැනීම

---------------------------------------------

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 " න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න දැනුවත් වී නොතිබුණි. එම නිසා එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු , ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා වියයුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

## 6.1 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය

------------------------------------------

### 6.1.1 ප්‍රසම්පාදනයන්

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ ප්‍රවාහන අවශ්‍යතාවය සඳහා සුබෝපභෝගී වෑන් රථ සහ කාර් රථ කුලියට ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවා තිබුණද ලංසු ඇගයීමේදී ආයතනයේ ප්‍රවාහන අවශ්‍යතාවය සඳහා ''නැනෝ කැබ් සේවාව'' ප්‍රමාණවත් බව පසුව තීරණය කර තිබූ අතර ඒ සඳහා එක් ලංසුවක් පමණක් ලැබී තිබුණි. ඒ අනුව ආයතනයට හොඳම මිලට (Best price) සේවාව සපයා ගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි.

(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.2 ඡේදය ප්‍රකාරව ප්‍රමාද වී ලැබෙන ලංසු භාර නොගත යුතු අතර ලංසු විවෘත නොකර ආපසු යැවිය යුතුය. සමාලෝචිත වර්ෂයේදී ආයතනය සඳහා වටිනාකම රු.150,000 ක්වූ ජංගම හිමොග්ලොබින් විශ්ලේෂණ යන්ත්‍ර (Portable Hemoglobin Analyzers) 03 ක් සහ එකක් රු.65 බැගින් වූ ස්ට්‍රිප් (Strip) 600 ක් මිල දී ගැනීමේදී මිල කැඳවුම් ලේඛනවල සඳහන් පරිදි ලංසු ඉදිරිපත් කලයුතු අවසාන දිනට පසු දිනයකදී මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයකින් අදාල භාණ්ඩ මිල දී ගෙන තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ආදායම හඳුනාගැනීම | • ඉන්වොයිසි නිකුත් කිරීමකින් තොරව ආදායම් හඳුනාගත් අවස්ථා පැවතීම. |
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | • ආයතනයේ අරමුණ ඉටුකර ගැනිමට අත්‍යාවශ්‍ය වැදගත් පුරප්පාඩු පිරවීමට කටයුතු නොකිරීම. |
| (ඇ) තොරතුරු තාක්ෂණ පොදු පාලනයන් | • ආයතනය සතුව වෘත්තීය අනතුරු සම්බන්ධව දත්ත පද්ධතියක් ස්ථාපිත කර පවත්වා නොගැනීම. |
| (ඈ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය | • ලංසු විවෘත කිරීමේ දිනය, වේලාව, ස්ථානය සහිතව ලංසු කැඳවීමේ ලේඛන සකස් කර නොතිබීම.<br>• ලංසු විවෘත කිරීම සඳහා කමිටුවක් පත්කර අනුමත කර නොතිබීම.<br>• ලංසු විවෘත කිරීම වාර්තා කිරීමට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමිත ආකෘතිපත්‍ර භාවිතා කර නොතිබීම. |